සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

| ශ්‍රේණිය / தரம் / Grade | කාලය / நேரம் / Time |
|---|---|
| 10 ශ්‍රේණිය | පැය 03 යි. |

# ක්‍රිස්තියානි ධර්මය - I

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

උපදෙස්:

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- **අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න සඳහා දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු අතුරෙන් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි කව අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

---

1. දිවැසිවරුන් පවසන ආකාරයට ජේසුතුමා උපන් ගම වූයේ,
   (1) නාසරෙත් (2) කානා (3) ඒප්‍රාතා (4) නායින්

2. යුදා සමාජයේ පව්කරුවන් ලෙස සැලකූ අය වනුයේ,
   (1) පරිසිවරු හා අන්‍ය ජාතිකයන් (2) කාන්තාවන් හා රෝගීන්
   (3) ධනවතුන් හා වහලුන් (4) අන්‍ය ජාතිකයන් හා උත්තම පූජකයන්

3. ජේසුස් වහන්සේගේ සේවකත්වය ගැන ඉතියෝපීය නපුංසකයාට පැහැදිලිව කතා කළ තැනැත්තා,
   (1) පිලිප්තුමා (2) ස්තේපන්තුමා (3) ප්‍රොකෝරස් (4) තීතස්

4. අයුක්ති සහගත හා අසාධාරණ ක්‍රියා පිළිබඳව ජනතාවට අවබෝධ කර දීමට උත්සාහ කළ නව ගිවිසුමේ වැදගත් පුද්ගලයකු වන්නේ,
   (1) හෙරෝද් රජ (2) සීමොන් නම් පරිසියා
   (3) කායිරස් නම් පූජකයා (4) ස්නාවක ජොහාන්

5. "ඔහු මිදි යුෂවත්, මත්පැන්වත් නොබොන්නේය" මෙසේ පවසන ලද්දේ කවරෙකු විසින් කා හටද?
   (1) සෙකරියස් විසින් එළිසබෙත්ට (2) ගාබ්‍රියෙල් දේවදූතයා විසින් සෙකරියස්ට
   (3) එළිසබෙත් විසින් මරියාට (4) ග්‍රාබියෙල් දේවදූතයා විසින් ජෝසප්ට

6. දිවැසිවර යෙසායා විසින් ප්‍රකාශ කළ අන්ධකාරයේ හා මරණ සෙවණේ සිටින්නවුන්ට ආලෝකය උදා කරන බව එම සත්‍යතාව ස්ථිර කරනු ලැබූ තැනැත්තා,
   (1) සෙකරියස් (2) මරියතුමිය (3) ජෝසප් (4) එළිසබෙත්

7. දාවිත්ගේ නුවර ලෙස සලකන්නේ,
   (1) නාසරෙත් (2) ජෙරුසලම (3) බෙත්ලෙහෙම (4) සමාරිය

8. ව්‍යවස්ථාව තමන්ගේ වාසියට අර්ථකථනය කරගත්තේ,
   (1) නායක පූජකයන් (2) සාමාන්‍ය ජනතාව (3) ලෙවිවරු (4) පරිසිවරු

9. ලිඛිත ව්‍යවස්ථාව පමණක් පිළිගනු ලැබුයේ,
   (1) පරිසිවරු (2) සද්දුස්සිවරු (3) එසීනවරු (4) සෙලට්වරු

Past Papers Wiki

10. ජේසුතුමාගේ අධිකාරී බලය ගැන ඇති වූ ප්‍රශ්නයේදී උන්වහන්සේ වදාළ උපමාව
(1) මිදිවත්ත හා ගොවීන් පිළිබඳ උපමාව (2) යහපත් සමාරිතයා පිළිබඳ උපමාව
(3) පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාව (4) පොහොසත් මෝඩයා පිළිබඳ උපමාව

11. "සීසර්ගේ දේ සීසර්ටත් දෙවියන්ගේ දේ දෙවියන්ටත් දෙන්න" මෙම ප්‍රකාශයෙන් වටහා ගත හැක්කේ,
(1) ඉගෙනීමට එරෙහි නොවී කටයුතු කරන්න.
(2) ප්‍රශ්නයේ යටි අරමුණ තේරුම් ගත නොහැකිය.
(3) ලෞකික රාජ්‍ය වෙනුවෙන් යුතුකම් ඉටු කරන්න.
(4) දේව රාජ්‍ය කිසිසේත් ලෞකික රාජ්‍යයට සමාන නොකළ නොහැකි බව.

12. ජේසුස් වහන්සේගේ ජීවිතයේ දී අවසාන දින කීපයේ සිදුවූ සිදුවීමකි.
(1) විශේෂ රෝගියෙකු සුව කිරීම
(2) දේව මාලිගය පවිත්‍ර කිරීම.
(3) අන්‍ය ජාතික ගමකට පිවිසීම.
(4) ශ්‍රාවකයන් සමඟ කානා නුවර විවාහ මංගල්‍යයකට සහභාගි වීම.

13. "පරීක්ෂාවට නොවැටෙන පිණිස නැගිට යාච්ඤා කරන්න" මෙසේ ජේසුතුමා පැවසුවේ,
(1) පන්දහසකට කෑම දීමට පෙර (2) ශ්‍රාවකයන් ධර්මදූත සේවයට පිටත් කිරීමට පෙර
(3) ගෙත්සෙමන උයනේ යාච්ඤා කරන විට (4) දින හතළිහක් පාළුකරයේ යාච්ඤා කරද්දී

14. "ඔබ යුදෙව්වන්ගේ රජ ද" මෙසේ විමසූ පිලාත්ට අවශ්‍ය වූයේ,
(1) ජේසුස් වහන්සේගේ නිර්දෝෂී බව විමසා වරදට ලක් නොකිරීමට
(2) ජේසුතුමා රජ කෙනෙකු නම් ඔහුට විරුද්ධව නඩු පැවරීමට
(3) පරිසින් හා නායක පූජකයන්ගේ කැමැත්ත ඉටු කිරීමට
(4) ජේසුගෙන් පුදුම ක්‍රියාවක් ඉටු කර ගැනීමට කැමැත්තෙන් සිටි නිසා

15. සොහොන වෙත ගමන් කළ කාන්තාවන් බලාපොරොත්තු නොවූයේ,
(1) ජේසුතුමාගේ සිරුර ආලේප කිරීමට හැකිවේද යන්න.
(2) සුවඳ ද්‍රව්‍ය ආලේප කිරීමට කිසිවෙකු උපකාර කරාවිදෝ යන්න.
(3) මළ නමුත් උත්ථාන වී ජීවමානව සිටින ජේසුතුමා දැකීමට
(4) හේවායන්ගේ තර්ජන ගර්ජනවලට මුහුණ දීමට

16. දෙවියන් වහන්සේගේ වැඩ සිටීම සංකේතවත් වන්නේ,
(1) ජලය (2) වළාකුල (3) සුළඟ (4) වර්ෂාව

17. ජේසුතුමාට පැමිණි දෙවන පරීක්ෂාවේ අදහස වනුයේ,
(1) ජේසුතුමා මිහිපිටට පැමිණියේ ලෞකික රාජ්‍යයක් පිහිටුවීමට නොව දේව රාජ්‍ය ගොඩ නැගීමට ය.
(2) ජීවත්වීමට අවශ්‍ය පමණ ධනය ලැබිය යුතු බව
(3) ජනප්‍රියතාව තුළ දේව රාජ්‍ය ප්‍රකාශ කිරීම වඩාත් පහසු බව
(4) දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමට තැන්පත් ධනයක් අවශ්‍ය බව

18. අබ ඇටයේ උපමාවෙන් "අහසේ පක්ෂීන්" යනුවෙන් අදහස් කරනුයේ,
(1) අබ ගස විශාල ගසක් බව
(2) අන්‍ය ජාතීන්ට ද දේව රාජ්‍යයට හිමිකම් දැක්විය හැකි බව.
(3) පක්ෂීන් නිතර ගස් ආශ්‍රිතව සිටින බව
(4) පක්ෂීන් ලෙස දැහැමි විය යුතු බව

19. ප්‍රාතිහාර්ය (දේව බල සලකුණු) සඳහා "ඩුනෝමීස්" යන වචනය භාවිතා කරනු ලැබුවේ,
(1) ජොහාන් සුබාරංචියයි. (2) මතෙව්, මාර්ක් ලූක් සුබාරංචි
(3) අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොත (4) පාවුලුතුමාගේ ලිපි

20. සොබාදහම කෙරෙහි ආධිපත්‍ය දැක්වෙන සිද්ධියක් නොවන්නේ,
(1) කුණාටුව සංසිඳුවීම. (2) පන්දහසකට කෑම දීම
(3) කානා නුවර වතුර වයින් කිරීම. (4) ලාසරස් උත්ථාන කිරීම.

21. දේව රාජ්‍ය සම්බන්ධ සුවිශේෂ ප්‍රකාශනයක් වන්නේ,
(1) දේව රාජ්‍ය හිමිවන්නේ ජුදෙව්වන්ට පමණකි.
(2) දේව රාජ්‍ය පතන්නෝ දිනපතා දේවස්ථානයට යා යුතුය.
(3) දෙවියන් වහන්සේගේ තීරණය අනුව දේවරාජ්‍ය පරිපූර්ණත්වයට පැමිණේ.
(4) දෙවියන් වහන්සේ නිරතුරුවම බලා සිටින සේක.

22. "දේව රාජ්‍යයේ ආහාර වළඳන තැනැත්තේ භාග්‍යවන්තය" යනුවෙන් ඇති ජුදෙව්වරුන්ගේ අදහසට ජේසුතුමා පැවසූ උපමා කතාව,
(1) මහා මංගල භෝජනය (2) අත්තික්කා ගස
(3) යහපත් සමාරිතයා (4) අකාරුණික දාසයා

23. "දිළිඳු වූ ඔබ භාග්‍යවන්තය" මින් අදහස් වන්නේ,
(1) දිළින්දන් ආශීර්වාද ලද්දන් බවයි.
(2) දෙවිදුන් තුළ දිළිඳු බවින් රැඳී සිටීම ගැන.
(3) හැකි තරම් තම කල්පැවැත්මට දේවල් ඉටු කරගත යුතු බව
(4) දිළිඳුකම ශාපලත් බවේ සංකේතයක් නොවේ.

24. ජේසුතුමා දේව රාජ්‍යයේ ගැඹුරු ගුණධර්ම පොදු ජනතාවට පිළිගැන්වූ භාෂාව නම්,
(1) ග්‍රීක් (2) ලතින් (3) අරාබි (4) ඇරමැයික්

25. ආබ්‍රහම්ගේ දියණිය හා පුතණුවන් වන්නේ,
(1) ඊසාක් හා දිනා (2) ඊසාක් හා රෙබෙකා
(3) සාකේවුස් සහ කුදු ස්ත්‍රිය (4) සමාරිය ස්ත්‍රිය හා ලෙවි

26. ජේසුස් වහන්සේගේ කාලයේ උත්තම පූජක ධුරය දැරුවේ,
(1) අන්නස් (2) කයාපස් (3) නිකදේමුස් (4) ජෝසප්

27. ජේසුස් වහන්සේගේ පැමිණීමත් සමග දේව රාජ්‍යයේ ස්ථාපිත කාර්ය ඇරඹී ඇති බව ප්‍රකාශයට පත් වූයේ,
(1) ගලීල මුහුදු අසලදී ශ්‍රාවකයන් කැඳවීමේදී
(2) නාසරත් නුවර සිනගෝගයේ දී කළ ප්‍රකාශයෙන්
(3) සමාරිය ළිඳ ළඟදී හමුවූ ස්ත්‍රිය සමඟ කළ සංවාදයෙන්
(4) පාළුකරයේ දී පරීක්ෂාවට පිළිතුරු ලබා දීමේ දී

28. කිතුනුවන් ලෙස දේව රාජ්‍යයට සාක්ෂි දැරීම යනු,
(1) යාච්ඤාවේ භාවනාවේ ජීවිතයක් ගත කිරීමයි.
(2) තමන් සතු දේ අන් අය සමඟ බෙදා ගැනීමයි.
(3) දේව කැමැත්ත මුළුමනින්ම ඉටු කිරීමයි.
(4) කිතුණුවන් ලෙස අන් අය ඉදිරියේ හැසිරීමයි.

29. ධනවතෙකුට දේව රාජ්‍යයට යෑමේ අපහසුව ගැන ජේසුතුමා පැවසුවේ,
(1) ධනවතෙකුට දේව රාජ්‍යයට ඇතුළු වීම දුෂ්කර බවයි.
(2) ධනවතෙකුට දේව රාජ්‍යයට ඇතුළු වීමට වඩා ඔටුවකුට ඉදිකටු මලින් රිංගායාම පහසු බවයි.
(3) දේව රාජ්‍යයට ඇතුළු විය හැක්කේ දිළින්දන්ට පමණක් බවයි.
(4) ඉදිකටු මල ඔටුවකුට වඩා කුඩා බවයි.

30. ශ්‍රාවකයන්ගෙන් ජේසුතුමා බලාපොරොත්තු වූයේ,
(1) ත්‍යාගශීලී සේවයයි. (2) බැගැපත් ජීවිතයයි.
(3) පූර්ණ පරිත්‍යාගයයි. (4) ප්‍රතිපත්තිගරුක ජීවිතයයි.

31. කිතුනු පවුලක පූර්ණත්වය හා ශුද්ධවත් බව දකින්නට ලැබෙන්නේ,
(1) ශක්තිමත් ආර්ථිකයක් ගොඩනගා ගැනීමයි. (2) දවසේ නියමිත වේලාවකදී යාඥා කිරීමයි.
(3) වගකීම නොපිරිහෙලා ඉටු කිරීමයි. (4) සියලුම සාමාජිකයන්ගේ සහයෝගීතාවයයි.

32. මුල් කිතුනු සභාවේ එදා තිබූ වර්තමානයේ නැති ක්‍රියා පිළිවෙත නම්,
(1) සියල්ල පොදුවේ තබා ගැනීම (2) යාච්ඤාව හා භාවනාව
(3) ධර්මදූත සේවාව (4) නායකත්වයට මුල් තැන දීම

33. ස්වාමිවරුන් දෙදෙනෙකුට එකවර සේවය කරන්නට කිසිම සේවකයකුට නොහැකිය. මින් ස්වාමිවරුන් දෙදෙනා වන්නේ,
(1) දෙවියන් වහන්සේ හා තාන්නමාන්නය. (2) දෙවියන් වහන්සේ හා වස්තුවය.
(3) දෙවියන් වහන්සේ හා දේශපාලනය (4) දෙවියන් වහන්සේ හා සැප පහසුකම්ය.

34. වපුරන්නා පිළිබඳ උපමාවේ ගල් මත වැටෙන බීජවලට සමාන වන්නේ,
(1) පණිවිඩය මඳ කලකින් අමතක කරන අය ය.
(2) පණිවිඩය නපුරා විසින් පැහැර ගනු ලැබූ අය ය.
(3) පණිවිඩය ලෞකිකත්වයට යටපත් කරන අය ය.
(4) පණිවිඩය උදාසීනව පිළිගන්නා අය ය.

35. අධෛර්යය නොවී නොකඩවා යාච්ඤා කළ යුතු බව පෙන්වා දෙන්නේ,
(1) පරිසියා හා අයකැමියා පිළිබඳ උපමාවෙනි.
(2) මිදිවත්ත හා වැවිලිකරුවන් පිළිබඳ උපමාවෙනි.
(3) වැන්දඹුව හා විනිශ්චයකාරයා පිළිබඳ උපමාවෙනි.
(4) ලාසරස් හා ධනවතා පිළිබඳ උපමාවෙනි.

36. සැබෑ ප්‍රේමයේ උතුම් ආදර්ශය නම්,
(1) සතුරාට සමාව දීම ය. (2) මිතුරන් වෙනුවෙන් සිය දිවි පිදීම ය.
(3) තමා සතු සියලු දේ අන්‍යයන්ට දීම ය. (4) අසල්වාසීන්ගේ අවශ්‍යතා ඉටු කිරීම ය.

37. ක්‍රිස්තුස් වහන්සේගේ දෙවන පැමිණීම සිදුවන්නේ,
(1) ගැලවීමේ කාර්ය සම්පූර්ණ කිරීමටයි. (2) ශ්‍රාවක පොරොන්දු ඉටු කිරීමටයි.
(3) මුළු මැවිල්ල වෙනස් කිරීමටයි. (4) සභාව නවතාවයකට පත් කිරීමටයි.

38. දේව රාජ්‍යයට අනුකූලව ජීවත්වීමට - නිවැරදිම පිළිතුර,
(1) දේව ආශීර්වාද අවශ්‍ය වේ.
(2) දේව ගැතිවරුන්ගේ ආදර්ශය අවශ්‍ය වේ.
(3) ගුරුවරුන්ගේ දෙමාපියන්ගේ මග පෙන්වීම අවශ්‍ය වේ.
(4) ශුද්ධාත්මයාණන්ගේ මග පෙන්වීම අවශ්‍ය වේ.

39. ඔබ ජීවත්වන සමාජයට ඔබෙන් ඉටුවිය යුතු වගකීම නම්,
(1) විශ්වාසවන්ත වීම. (2) අවංක වීම. (3) සමාව දීම හා ප්‍රේමය දැක්වීම. (4) මේ සියල්ලම

40. දෙවියන් වහන්සේ ලෝකය මවා මිනිසාට භාර දුන්නේ,
(1) තම නිදහසට අනුව ඕනෑම දෙයක් කිරීමට හැකියාව
(2) සීමිත සම්පත් ප්‍රමාණයක් භුක්ති විඳීමට
(3) දෙවිඳුන් සමග සුහදතාවයෙන් මැවිල්ල සංවර්ධනය කර ආරක්ෂා කිරීමට
(4) මැවිල්ලේ අධිපතියා ලෙස ක්‍රියා කිරීමට

Past Papers Wiki

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**தென் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education, Southern Province**

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය | ක්‍රිස්තියානි ධර්මය - II | කාලය / நேரம் / Time: |

නම / பெயர் / Name: .....  විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: .....

සැලකිය යුතුයි:

- **පළමුවැනි ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව සම්පූර්ණ ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරාගත් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ද හිමිවේ.**

---

1) කෙටි පිළිතුරු සපයන්න.

i. දේව රාජ්‍යයේ පුරවැසියන් කරදර වීම අනවශ්‍ය බව ජේසුතුමා ඉදිරිපත් කළ උදාහරණ දෙකක් ලියන්න.

ii. දේව රාජ්‍යයේ තීරණාත්මක මොහොත වන්නේ කවදාද? ඒ සඳහා සූදානම් විය යුතු ආකාරය ලියන්න.

iii. ස්නාවක ජොහාන් පිළිබඳ වැදගත් කරුණු දෙකක් ලියන්න.

iv. ජුදෙව්වන්ගේ ප්‍රසිද්ධ මංගල්‍යය දෙකක් ලියන්න.

v. ජුදෙව්වන් නමස්කාර කරන වැදගත් ස්ථාන දෙකක් සඳහන් කරන්න.

vi. නාසරෙත් ප්‍රකාශනය තුළ ඇති සුවිශේෂී කරුණු දෙකක් ලියන්න.

vii. ධීවරයන් නොවූ ජේසුතුමාගේ ශ්‍රාවකයන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

viii. ජේසුස් වහන්සේ ශ්‍රාවකයන්ට ප්‍රකාශ වූ අවස්ථා දෙකක් ලියන්න.

ix. ජේසුතුමා පරිසිවරුන් සමග ඇතිකරගත් සංවාද දෙකක් ලියන්න.

x. ධනවත් වීම ගැන කල දේශනාවන් සඳහා ජේසුතුමා ඉගැන්වූ උපමා කතා දෙකක් ලියන්න.

2) i. අන්තිම රාත්‍රී භෝජනයේ දී ජේසුතුමා කළ කී දේවල් දෙකක් ලියන්න.

ii. කුරුසිපත්වීමට පෙර ජේසුතුමා යාච්ඤා කළේ කුමන ස්ථානයකද? එම යාච්ඤාවේ හරය කරුණු දෙකකින් පැහැදිලි කරන්න.

iii. ජේසුතුමා කුරුසිපත් වී ජීවිතය පූජා කිරීම නිසා අපට ලැබුණු ආශීර්වාද 5ක් ලියන්න.

3) i. දේව රාජ්‍යයේ වර්ධනය ගැන ජේසුතුමා ඉගැන්වූ උපමා කතා දෙකක් සඳහන් කරන්න.

ii. ඉන් එක් උපමාවක් සම්පූර්ණයෙන්ම ලියන්න.

iii. දේව රාජ්‍ය ලබා ගැනීමට අප විසින් කළ යුතු දේවල් පහක් ලියන්න.

PAST PAPERS WIKI

Past Papers Wiki

4) i. ජේසුතුමා කළ ප්‍රාතිහාර්ය වර්ග හතර ලියන්න.

ii. ඉන් එක් කොටසකට අදාළ ප්‍රාතිහාර්යයක් සම්පූර්ණයෙන් ම ලියන්න.

iii. ඇදහිල්ල තුළ අපට ද ප්‍රාතිහාර්යයන් අත්දැකීමට හැකි බව ඔබේ ජීවිත අත්දැකීමක් තුළින් විස්තර කර ලියන්න.

5) i. ශුද්ධ බයිබලයේ සැකැස්ම ගැන කරුණු හතරක් ලියන්න.

ii. ශුද්ධ බයිබලයෙන් අපට ලැබෙන මහ පෙන්වීම් තුනක් ලියන්න.

iii. කිතුණු අපහට ශුද්ධ බයිබලයේ වැදගත්කම ගැන කරුණු පහක් ලියන්න.

6) i. ස්නාවක ජොහාන්ට පැවරුණු කාර්යය කුමක් ද? ඒ සඳහා උන්වහන්සේ කළ දේ ලියන්න.

ii. ස්නාවක ජෝහාන් තුමා කතා කළ කොට්ඨාශ තුනක් ලියා ඔවුන්ට දුන් උපදේශ තුන ද ලියන්න.

iii. ස්නාවක ජොහාන් චරිතයෙන් අපට ලබාගත හැකි ආදර්ශ තුනක් ලියා ඒවා ඔබේ ජීවිතය තුළින්ද ඉටු කරන ආකාර දෙකක් ලියන්න.

7) පහත සඳහන් මාතෘකා දෙකක් තෝරාගෙන කරුණු පහක් යටතේ විස්තර ලියන්න.

i. කිතු උපත

ii. දේව රාජ්‍ය

iii. ජේසුතුමාගේ බව්තිස්මය

iv. ජේසුතුමාගේ ශ්‍රාවකයන්

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi



Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library